රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் அமைச்சு
Ministry of Public Administration, Home Affairs and Provincial Councils & Local Government
ස්වදේශ කටයුතු අංශය (ග්‍රාම නිලධාරී පාලන)
உள்நாட்டலுவல்கள் பிரிவு (கிராம உத்தியோகத்தர்)
Home Affairs Division (Grama Niladari Administration)

මගේ අංකය / எனது இல / My No: HA/03/03/57-1
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.02.10

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**සෞභාග්‍යයේ දැක්ම අනුව රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීම - 2020**

ජනාධිපති කාර්යාලය මගින් රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩපිළිවෙල මේ වන විට ආරම්භ කර ඇති අතර, ඒ සම්බන්ධව 2020.02.07 වන දින විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් තොරතුරු ප්‍රසිද්ධියට පත් කර ඇත. අයදුම්පත්‍ර www.presidentsoffice.gov.lk වෙබ් අඩවියෙන් බාගත කල හැකිය. වැඩිදුර විස්තර 2020.02.07 දිනැති ලංකාදීප, දිනමිණ, Daily Mirror , Daily News සහ තිනකරන් යන පුවත්පත් වල සඳහන් වේ.

02. අයදුම්කරුවන් පූර්වාසන්න වසරකට වැඩි කාලයක් රැකියා විරහිතව සිටින බවත්, ඉල්ලුම්කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචිකරුවකු බවත්, ග්‍රාම නිලධාරී විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර ඉදිරිපත් කල යුතුය. (අයදුම්පත්‍රය මේ සමඟ අමුණා ඇත)

03. තවද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධි පාඨමාලාවක් හෝ එයට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඩිප්ලෝමාවක් 2019.12.31 වන දිනට සම්පූර්ණ කර ඇති සියළුම උපාධිධාරීන්ට මේ සඳහා අයදුම් කල හැකිය. ඒ අනුව 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා උපාධිය සම්පූර්ණ කර ඇති, අදාල කාලය තුල (උපාධිය ලබා ගත් දින සිට) රැකියා විරහිතව සිටි සියළුම උපාධිධාරීන්ටද මේ සඳහා අයදුම් කල හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

04. ඒ අනුව ඉල්ලුම්පත්‍ර නිර්දේශ කිරීමේදී ඉහත 03 ඡේදය පිළිබඳව ද ග්‍රාම නිලධාරීන් දැනුවත් කර මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව දන්වමි.

එස්.හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත - ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - ඔබගේ අංක PS/OMC/01/01 හා 2020.02.10 දිනැති ලිපිය අනුව කරු. දැ.ගැ.ස.

රාජ්‍ය පරිපාලන අංශය
பொது நிர்வாக பிரிவு
Public Administration Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
சுதந்திர சதுக்கம், கொழும்பு 07.
Independance Square, Colombo 07.
TP : +94 112 166 000/+94 112 696 211 - 13
Fax : 94 112 695 279
Email: info@pubad.gov.lk
Web : www.pubad.gov.lk

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division
"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05.
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.
TP : +94 115 999 615
Fax : +94 112 369 047
Email: gnadmin@moha.gov.lk
Web : www.moha.gov.lk

පළාත් සභා හා පළාත් පාලන අංශය
மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் பிரிவு
Provincial Councils & Local Government Division
330, යූනියන් පෙදෙස, කොළඹ 02.
330, யூனியன் பிளேஸ், கொழும்பு 02.
330, Union Place, Colombo 02.
TP : +94 112 305 326/7 or +94 112 303 280
Fax : +94 112 347 529
Email: secretary@pclg.gov.lk
Web : www.pclg.gov.lk